උඩපළාත ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 14 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.19,000 ක මුද්දර ගාස්තු, ලැබිය යුතු ආදායමක් සේ ගිණුම්ගත කිරීමෙන් එම වටිනාකමින් වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු ආදායම් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගතව තිබූ එහෙත්, වැඩ අවසන් කර නොතිබූ රු.440,031 ක් වටිනා කර්මාන්ත 03 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු.167,223 ක් වටිනා උපකරණ අයිතම 05 ක වටිනාකම රු.113,157 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු.54,066 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 ජුලි 20 දින මිල දී ගෙන තිබූ රු.29,600 ක් වටිනා පරිගණක උපාංග (UPS) 08 ක වටිනාකම රු.79,042 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු.49,442 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ හිට තිබූ රු.201,600 ක් වූ ත්‍රී රෝද රථ ගාස්තු ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
----------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයන් 02 ක ශේෂය, උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී රු.99,961,730 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
-------------------

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 09 ක එකතු වටිනාකම රු.51,714,375 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.4,619,789 ක් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතු වටිනාකම රු.12,917,322 ක් වූ අතර, එයින් අවුරුදු 05 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.956,810 ක් වී තිබුණි.

## 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.933,968 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේ දි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.5 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) | 59 | -- | සමාලෝචිත වර්ෂයට වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතු ව්‍යාපාර සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ii) | 218 | -- | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | xix වැනි පරිච්ඡේදයේ 7.1 වගන්තිය | -- | විශ්‍රාම ලැබූ විට රජයේ නිවාසයේ සන්තකය භාරදිය යුතු වුවත්, එසේ කටයුතු නොකල විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකු සම්බන්ධව කටයුතු කර සන්තකය පවරා ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | 571(3) | 757,214 | 2012 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 16 ක දී තැන්පත් කර තිබූ අත රැඳවුම් මුදල් හා මිශ්‍ර තැන්පතු මුදල් |

| | | | |
|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ඇ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>------------------------- | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | 2,827,662 | පරිගණක හා පරිගණක උපාංග සටහන් කිරීමට ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.67,801,354 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,525,414 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
---------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,534,000 | 1,969,320 | 2,009,921 | 4,414,656 | 2,734,000 | 2,043,724 | 2,074,789 | 4,455,257 |
| (ii) | කුලී | 2,935,000 | 1,986,504 | 1,929,696 | 774,983 | 1,990,000 | 1,946,581 | 1,913,012 | 718,175 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,000,150 | 1,629,090 | 1,629,090 | -- | 1,800,150 | 1,850,248 | 1,850,248 | -- |
| (iv) | වෙනත් ආදායම් | 27,400,000 | 60,325,325 | 41,098,472 | 41,784,343 | 25,050,000 | 36,898,464 | 39,505,348 | 23,412,155 |
| | එකතුව | 35,869,150 | 65,910,239 | 46,667,179 | 46,973,982 | 31,574,150 | 42,739,017 | 45,343,397 | 28,585,587 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය
--------------------------------------

සමස්ථ ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.28,585,587 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.46,973,982 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 64 ක් විය.

2.2.3 වරිපනම් හා බදු
------------------

(අ) වරිපනම්
------------

(i) 2017 ජනවාරි 01 දිනට හිඟ හිටි වරිපනම් ශේෂය රු.2,205,112 ක් වූ අතර, 2017 වර්ෂයේ බිල් කිරීම් රු.1,394,500 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉන් අය කර තිබුණේ පිළිවෙළින් රු.700,991 ක් හා රු.874,722 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක් හා සියයට 63 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසන්

දිනට හිඟ ශේෂය රු.2,023,898 ක් වූ බැවින්, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි. 2018 අප්‍රේල් 30 දින වන විට රු.1,855,218 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වර්ෂ 08 ක කාලයක සිට රජයේ ආයතන 04 කින් අය විය යුතු රු.71,157 ක වරිපනම් ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2018 අප්‍රේල් 30 දිනට රු.52,237 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි කාලයක් වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ පුද්ගලයින්ගෙන් රු.1,377,157 ක මුදලක් සභාවට අය විය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම් බදු

-----------

වර්ෂ 05 කට අධික කාලයක සිට පුද්ගලයින් 09 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ රු.24,048 ක ඉඩම් බදු ශේෂයක්, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජල බදු

---------

(i) 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටි ජල ගාස්තුව රු.2,191,131 ක් වී තිබූ අතර, මෙම ජල ගාස්තු හිඟය තුළ දැල්පිටිය ප්‍රදේශයේ සහ දොළුව ප්‍රදේශයේ අක්‍රියව පවතින ජල මූලාශ්‍රවලින් අය විය යුතු රු.837,868 ක වටිනාකමක් ද ඇතුළත්ව තිබුණි.

(ii) ජල පාරිභෝගිකයින් 240 දෙනෙකුගෙන් 2005 වර්ෂයේ සිට හිඟ හිට තිබූ රු.82,145 ක ජල ගාස්තු ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී

------

(අ) ගෙවල් කුලී

-------------

වර්ෂ 10 කට අධික කාලයක සිට නිලධාරීන්/ සේවකයින් 06 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ රු.6,757 ක නිවාස කුලී ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර කුලී

-----------------

සභාවට අයත් පුස්සැල්ලාව උප කාර්යාලයේ ලේඛනවලට අනුව, රු.386,658 ක කඩ කාමර කුලී ශේෂයක් සහ දොළුව පොදු වෙළඳ පොළ හා සති පොළෙහි කඩ කාමර 06 කින් රු.37,657 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.1,513,745 ක් හා මුද්දර ගාස්තු රු.40,270,598 ක් අය විය යුතුව තිබුණි. මෙම ශේෂයෙන් 2018 මැයි 15 දින වන විට උසාවි දඩ රු.82,783 ක් හා මුද්දර ගාස්තු රු.40,251,598 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

(අ) අරමුණුගත කාර්යයන් ඉටු නොකිරීම

-----------------------------------------

පළාත් පාලන ආයතන මහජන සෞඛ්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇතත්, සභා අරමුදල්වලින් මහජන සෞඛ්‍යට අදාළ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.682,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 5 ක අගයක් ගෙන තිබුණි. ඒ යටතේ ඉදිකර තිබූ වැසිකිළි පද්ධති දෙක ද කාර්යාල නිලධාරීන් වෙනුවෙන් කළ ඉදිකිරීම් විය.

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තියේ සඳහන් අරමුණුගත කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වෙන් කර තිබූ අයවැය ප්‍රතිපාදන එම අරමුණු සඳහා යෙදවීමකින් තොරව වැය විෂයන් 05 කට වෙන් කර තිබූ රු.340,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබූ අතර, තවත් වැය විෂයන් 05 කට වෙන් කර තිබූ රු.480,000 ක ප්‍රතිපාදනවලින් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ සංවර්ධන යෝජනා ඉටු කිරීමේ දී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී මාස 02 ත් මාස 05 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව කර්මාන්ත 16 ක වැඩ ආරම්භ කිරීම සඳහා ගිවිසුම්ගතව තිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

වෙන්කර එකතු කරනු ලබන කසළවලින් දිරන කසළ දිනකට ටොන් 02 ක් පමණ එකතු වුව ද, මෙම කසළ යොදා ගනිමින් පොහොර නිෂ්පාදනයට හෝ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

-----------------

දෛනිකව එකතු කරන ලද කසළ කිසිදු කළමනාකරණයකින් තොරව පුස්සැල්ලාව නගර මධ්‍යයේ පිහිටි ප්‍රාදේශීය සභාවට අයත් නගර ශාලා භූමියේ වලකට බැහැර කිරීමෙන්, නගරයට පැමිණෙන ජනතාවට දැඩි සෞඛ්‍ය ගැටළු මතු වීමේ ඉඩකඩ හා හෝටල් හා ආපනශාලාවලට ද සෞඛ්‍ය ගැටළු ඇති වීමේ ඉඩකඩ පැවතුණි. තවද, ඒ ආශ්‍රිතව ආරම්භ වන ජල මූලාශ්‍රවලට වැසි දිනවල අපද්‍රව්‍ය මිශ්‍ර වීමේ ඉඩකඩක් ද පැවතුණි.

(ඊ) සිව් අවුරුදු සැලැස්ම

------------------------

2017 වර්ෂයේ සිට 2020 දක්වා කාලයට අදාළව ප්‍රාග්ධන වැය සම්බන්ධව පිළියෙළ කර තිබූ සිව් අවුරුදු සැලැස්ම තුළ ඉටු කිරීමට අපේක්ෂා කරනු ලබන කර්මාන්ත සහ ඊට අදාළ ඇස්තමේන්තු වටිනාකම පමණක් දක්වා තිබූ අතර, කර්මාන්තය ආරම්භ කිරීමට හා අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු, ප්‍රතිලාභීන් සංඛ්‍යාව, අධීක්ෂණ නිලධාරී විස්තර යනාදි කරුණු සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(උ) පරිසර සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂයට අදාළව පරිසර ඒකකය විසින් සකස් කර තිබූ සැලැස්ම තුළින් වැඩසටහන් 19 ක් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, මෙම වැඩසටහන් කුමන දිනවල, කුමන ප්‍රදේශවල ප්‍රජාව සඳහා ඉටු කරන්නේ ද යන්න පිළිබඳව විස්තරාත්මකව තොරතුරු දක්වා නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පසුගිය කාලය තුළ පුස්සැල්ලාව නගර ශාලාව කුලියට දීමෙන් සභාව සැලකිය යුතු ආදායමක් උපයා තිබූ අතර, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නගර ශාලාව කුලී පදනම මත හෝ මහජන අවශ්‍යතාවයන් සඳහා ලබා නොදී වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීම හේතුවෙන්, ආදායම් උපයා ගැනීමට තිබූ අවස්ථාවක් මඟ හැරී තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

(අ) විශ්‍රාමික, වැඩ තහනම් කළ සහ මිය ගොස් ඇති සේවකයින් 10 දෙනෙකුගෙන් 2014 සිට රු.127,271 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ස්ථාන මාරු වී සහ විශ්‍රාම ගොස් ඇති නිලධාරින් 04 දෙනෙකුගෙන් අය විය යුතු රු.347,406 ක් වටිනා ණය ශේෂ, නිරවුල් කර ගැනීමට 2018 මැයි 02 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

(අ) වෙළඳ බලපත්‍ර, පරිසර බලපත්‍ර, ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු හා දැන්වීම් පුවරු සම්බන්ධව පූර්ව වර්ෂයේ දී සමීක්ෂණයක් සිදු කර ලේඛනවල ඇතුළත් කර ඊට සාපේක්ෂව ගාස්තු අය කළ යුතු වුවත්, එවැනි සමීක්ෂණයක් සිදු කිරීම හෝ ලේඛනගත කිරීමකින් තොරව, ගාස්තු අය කරන අවස්ථාවේ දී ලේඛනගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

(ආ) පාරදෙක පොදු වෙළඳ පළ අසළ ඇති පර්චස් 03 ක ඉඩම ගිවිසුම්ගත නොවී බදු දීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.110,600 ක හිඟයක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) වසර 05 කට වරක් නව තක්සේරුවක් කර, බදු අය කළ යුතු වුවත්, සභාව විසින් 2005 වර්ෂයෙන් පසුව නව තක්සේරුවක් සිදු නොකර, පැරණි තක්සේරුව පදනම් කර ගනිමින් 2017 වර්ෂයට වරිපනම් බිල් කර තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

----------------------------------

(අ) සභාව සතු රු.7,205,839 ක් වටිනා වාහන 08 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ලී බඩු හා සවි කිරීම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

(අ) රු.6,009,602 ක් වටිනා ඩම්ප් ට්‍රක් රථය ඵලදායී කාර්යයකට යොදා ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) රු.102,990 ක් වටිනා අත් ට්‍රැක්ටරය සහ වටිනාකම හඳුනා ගත නොහැකි කැබ් රථයක් වසර 02 ත් වසර 24 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) පුස්සැල්ලාව නගර මධ්‍යයේ පිහිටි නගර ශාලා ගොඩනැගිල්ල කිසිදු නඩත්තුවකින් තොරව විනාශ වී යාමට ඉඩ හැර තිබුණි.

3.6 ප්‍රසම්පාදනය

---------------

කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

(අ) පුස්සැල්ලාව නගරයේ නොදිරන ද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.1,485,778 ක මුදලකට ඇස්තමේන්තු කර 2017 නොවැම්බර් 29 දින වැඩ නිම කර 2018 අප්‍රේල් 27 දින වන විට රු.1,338,088 ක කොටස් මුදල් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) පළමු පන්තියේ මි.මී.100 x 50 පරාල සහ පළමු පන්තියේ මි.මී.50 x 50 දැව යෙදීමට ඇස්තමේන්තු සකස් කර තිබූ වහලය සඳහා යොදා තිබූ දැව බොහොමයක් පළුදු සහිත නුසුදුසු තත්ත්වයේ ඒවා විය.

(ii) බිත්ති කපරාරුවල නිමාව දුර්වල මට්ටමක පැවතුණි.

(iii) බිත්තිවල තීන්ත ආලේපය නිසි පරිදි සිදු කර නොතිබුණි.

(iv) දොර පියනෙහි එනමල් තීන්ත දෙවරක් ආලේප කිරීමට ඇස්තමේන්තු කර එක් වරක් පමණක් ආලේපය සිදු කර ඇතත්, එය ද නිසි පරිදි සිදු කර නොතිබුණි.

(iv) 1:3 සිමෙන්ති හා වැලි මිශ්‍රණයෙන් ගොඩනැගිල්ල අභ්‍යන්තරයේ පොළව කපරාරු කළ යුතු වුවත්, එය පළුදු කර පරීක්ෂා කිරීමේ දි පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල මිශ්‍රණයක් යොදා තිබුණි.

(ආ) පුස්සැල්ලාව පොදු වෙළඳ පොළ වටා කුට්ටි ගල් ඇතිරීම සඳහා රු.1,857,969 ක මුදලකට ඇස්තමේන්තු කර 2017 ජුලි 24 දින වැඩ නිම කර, රු.1,645,969 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) නියමිත ප්‍රමාණයේ හා නියමිත ප්‍රමිතියේ ගල් සොයා ගැනීමට අපහසු වීම සඳහන් කර අවස්ථා දෙකක දී කාලය දීර්ඝ කර තිබුණ ද, පරීක්ෂණ අවස්ථාවේ දී අතුරා තිබුණු රතු පාට අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල්වල මතු පිට පාට සේදී දුර්වර්ණ වී හා සමහරක් ගල් කැඩී තිබීම නිසා, නියමිත ප්‍රමිතියට අනුකූල වී නොතිබුණි.

(ii) කොන්ක්‍රීට් ගල් අතර යොදා තිබූ ආරක්ෂිත වැටිය (Kerb Wall) අන්තර් සම්බන්ධිත ගලට වඩා අඟල් 1 ක් පමණ පහතින් තිබූ අතර, එම අඩුව පිරවීමට අඟල් 1 පමණ බදාම තට්ටුවක් යොදා තිබුණි. එසේ යොදා තිබූ බදාම තට්ටුව නියමිත ප්‍රමිතියට අනුකූල නොවීම නිසා, බොහෝ ස්ථානවල කැඩී ගොස් තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------

4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 04 ක සියයට 26 සිට සියයට 291 දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 33 සිට සියයට 71 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය
-----------------------

අභ්‍යන්තර විගණකට අභ්‍යන්තර විගණන කටයුතුවලින් පරිබාහිර වෙනත් රාජකාරී පැවරීම නිසා, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

5. පද්ධති හා පාලන
------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ  අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතීම |
| | | ii. | ගිවිසුම් අත්සන් නොකර බදු දේපළ ලබා දීම |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොවීම |
| | | ii. | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| | | iii. | වත්කම්වල අයිතිය පවරා ගැනීමේ දුර්වලතා පැවතීම |
| (ඇ) | ණයගැතියන් හා ණයහිමියන් | | දිගු කාලීනව පැවත එන ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් නොවීම |
| (ඈ) | අයවැය පාලනය | i. | ඇස්තමේන්තු ප්‍රතිපාදන වැය නොකිරීම |
| | | ii. | ඇස්තමේන්තුගත ආදායම් අය නොකිරීම |